ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව
CEYLON FISHERY HARBOURS CORPORATION
இலங்கை மீன்பிடித் துறைமுகங்கள் கூட்டுத்தாபனம்
General - 0112523051 Fax - 0112522217 Email - info@cfhc.gov.lk Web - www.cfhc.gov.lk

2026.09.11

.....

.....

.....

මහත්මයාණෙනි,

කිරින්ද මෝයකටෙහි සහ බේසමෙහි තැන්පත් වී ඇති වැලි 16,234m^3 ඉවත් කිරීමට කියුබ් 03 ප්‍රමානයේ ටිපර් රථ 04 ක් කුලී පදනම මත ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම

ප්‍රසම්පාදන අංකය - CFHC/PD/TIPPER/KIRINDA/2026/100

කොළඹ - 15, රොක්හවුස් පටුමග පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට අයත් කිරින්ද ධීවර වරායේ මෝයකටෙහි තැන්පත් වී ඇති 16,234m^3 ක (අවම) වැලි ප්‍රමාණයක් ඉවත් කිරීමට අදාලව කියුබ් 03 ප්‍රමානයේ ටිපර් රථ 04 ක් යන්ත්‍ර ක්‍රියාකරු සහිතව කුලී පදනම මත ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ. යන්ත්‍ර ක්‍රියාකරු සහිතව, ඉන්ධන සහ යන්ත්‍රයට අවශ්‍ය දෑ සහ නඩත්තු කටයුතු අදාල ආයතනය විසින් සපයා ගත යුතුය. තවද දෛනික පදනම මත ගෙවීම් සිදු කරන අතර පෙ.08.30 සිට ප.ව.17.30 දක්වා සේවය සැපයිය යුතුවේ. තවද වරායේ සිට 300m ක පමණ දුරක් වැලි ප්‍රවාහනය කළ යුතුවේ. එමෙන්ම මෙම කාර්යය වෙනුවෙන් යොදා ගනු ලබන ටිපර් රථ යම් කාර්මික දෝෂයකට ලක්වීමක් සිදු වුවහොත් ඒ සඳහා වෙනත් ටිපර් රථයක් සැපයිය යුතුවේ. අවශ්‍ය අවම දින ගනණ 40 වේ

ටිපර් රථ පිළිබඳ පිරිවිතරයන් පහත දක්වා ඇති අතර වැඩි විස්තර සඳහා යාන්ත්‍රික ඉංජිනේරු අංශය 011-2529364 විමසන්න.

මේ සම්බන්ධව මිල ගණන් පහත විස්තර වලට අනුව 2026.09.25 වන දින පෙ.ව.11.00 ට ප්‍රථම කොළඹ - 15 රොක්හවුස් පටුමග ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ප්‍රසම්පාදන අංශයට ලැබීමට සලස්වන්න.

විස්තරය	මුදල රු.
කියුබ් 03 ප්‍රමානයේ ටිපර් රථ 01 ක් සඳහා	රු.
කියුබ් 03 ප්‍රමානයේ ටිපර් රථ 04 සඳහා	රු.
වෙනත් වියදම්	
වැට් බදු	

- **කියුබ් 03 ප්‍රමානයේ ටිපර් රථ 04 සඳහා පහත විස්තර ලබාදෙන්න.**

අනු අංකය	MODEL	CAPACITY	TYPE	TIPPER WEIGHT	YEAR OF MANUFACTURE
01.					
02.					
03.					
04.					

ඉහත කාර්යය නිම කිරීමට ගතවන දින ගණන - දින 40 කි.

01. මිල ගණන් වලංගු කාලය සඳහන් කරන්න.

02. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට කොළඹ - 15, රොක්හවුස් පටුමගෙහි පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රසම්පාදන කළමණාකාර වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර, ආපසු නොගෙවනු ලබන රු.2000.00 ක ගාස්තුවක් කොළඹ 15, රොක්හවුස් පටුමග අංක 15 හි පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ මුදල් අයකැමි වෙත ගෙවීම මගින් සැකසූ සම්පූර්ණ ප්‍රසම්පාදන ලියකියවිලි කට්ටලයක් ප්‍රසම්පාදන අංශයෙන් මිලදී ගත හැකි අතර කිරින්ද ධීවර වරායේ මුදල් අයකැමි වෙත ගෙවීම මගින් සැකසූ සම්පූර්ණ ප්‍රසම්පාදන ලියකියවිලි කට්ටලයක් මිලදී ගත හැකිය. මෙම ලියකියවිලි කාර්යාලීය දිනයන්හිදී 2026.09.11 දින සිට 2026.09.24 දින දක්වා පෙ.ව 09.00 සිට ප.ව 3.00 දක්වා ලබාගත හැකි අතර අදාල වරාය වෙතින් ද ප්‍රසම්පාදන ලියකියවිලි මුදල් අයකැමි වෙත ගෙවීමෙන් අනතුරුව ලබාගත හැක.

03. මිල ගණන් භාරගන්නා අවසාන දිනය 2026.09.25 දින වන අතර පෙ.ව.11.00 ට පෙර අදාල මිල කැඳවුම කොළඹ - 15, රොක්හවුස් පටුමග, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කල යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එදිනට පෙර ඉහත ලිපිනයට ලැබීමට කටයුතු කල යුතුය. මිල ගණන් විවෘත කිරීම 2026.09.25 වන දින පෙ.ව.11.00 ට ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේ දී සිදුකරනු ලැබේ.

04. මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී රු.50000 (පනස්දහසක්) ක බැඳුම්කරයක් මුදලින් හෝ බැංකු ඇපකරයක් මගින් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. දින 90 ක කාලයකට වලංගු වන ලංසු ඇපකරයක් ලංසුකරු විසින් ලංසු ඉදිරිපත් කිරීමේ දී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට ලබා දීමට බැඳී සිටින අතර අදාල බැඳුම්කරය ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවකින් ලබාගන්නා ලද කොන්දේසි රහිත ඉල්ලුවිට ගෙවීමේ හැකියාව ඇති සභාපති,

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ - 15 නමට යොමුකරන ලද බැඳුම්කරයක් විය යුතුය.

05. තෝරාගත් ලංසුකරු මූලික ගිවිසුම් මිලෙන් 5% ක ක්‍රියාකාරීත්වය ඇපකරයක් (Performance Security) අත්පිට මුදල් තැන්පතුවක් ලෙස හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත ඉල්ලුම් කල සැනින් ගෙවන බැංකු ඇපකරයක් (Unconditional on demand bank guarantee) ලෙස ඉදිරිපත් කල යුතුය. එමෙන්ම එය සභාපති, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ - 15 යන නමට නිකුත් කල යුතුය.

06. කවරයේ උඩ වම්පස කෙලවර **"කිරින්ද මෝයකටෙහි සහ බේසමෙහි තැන්පත් වී ඇති වැලි ඉවත් කිරීමට කියුබ් 03 ප්‍රමානයේ ටිපර් රථ 04 ක් කුලී පදනම මත ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම"** ලෙස සඳහන් කල යුතුය.

07. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපතිතුමා සතුවේ.

වැට් ලියාපදිංචි අංකය : .....

(වැට් ලියාපදිංචි සහතිකය තිබේනම් මේ සමඟ අමුණන්න)

මුළු වියදම (අකුරෙන්) : .....

.....

ලංසුකරුගේ නම : .....

.....

ලංසුකරුගේ අත්සන : .....

නිල මුද්‍රාව : .....

සමාගමේ නම සහ ලිපිනය : .....

.....

.....

.....

සභාපති,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක : රොක්හවුස් පටුමග,කොළඹ -15.